

අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට
අදාළ රාජ්‍ය ගිණුම් පිළිබඳ කමිටුව මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන වාර්තා සම්බන්ධයෙන් ආයතන හාර අමාත්‍යවරයාගේ
නිරීක්ෂණ සහ ගන්නා පියවර ඉදිරිපත් කිරීම

அமைச்சு, திணைக்களம், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி நிறுவனங்களுக்கான அரசாங்க கணக்குகள்
தொடர்பான குழுவின் மூலமாக பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கும் அறிக்கை தொடர்பாக நிறுவனங்களுக்கு
பொறுப்பான அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் மேற்க்கொள்ளப்பட்ட நடவடிக்கைளைச் சமர்ப்பித்தல்

Presenting the actions taken and observations made by the Minister in charge of institutions regarding the reports submitted to the Parliament by the Committee on Public Accounts related to Ministries/Departments/Provincial Councils and Local Government Institutions

2022 වර්ෂය
2022 ஆம் ஆண்டு
Year – 2022

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර
மாவட்ட செயலகம் – கண்டி
District Secretariat – Kandy

අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු/පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අදාල රාජ්‍ය ගිණුම් පිළිබඳ කමිටුව මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන වාර්තා සම්බන්ධයෙන් ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගන්නා පියවර ඉදිරිපත් කිරීම - 2022

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර (වැය ශීර්ෂය - 258)

රාජ්‍ය ගිණුම් පිළිබඳ කමිටුව මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන වාර්තා සම්බන්ධයෙන් ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ	ගණන් දීමේ නිලධාරි විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
2020.08.28 දිනැති අක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගනකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම	2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර අප්‍රමාදව 2023.02.27 දින විගණන අධිකාරි - ජාතික විගණන උප කාර්යාලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර වෙත ඉදිරිපත් කර ඇත.	2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි 11.1 අනුව අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් නැත. 2023 වර්ෂයට අදාල වාර්තාද 2024.06.13 දින යොමු කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම	<u>වැඩ තහනම් කර ඇති නිලධාරීන්</u> ➢ ආර්.එල්.ඒ.කේ. පෙරේරා (රියදුරු) විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර ඇති අතර, නිලධාරියා නැවත සේවයේ පිහිටුවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත. ඒ අනුව 2023.03.31 දින ජර්නල් සටහනක් මගින් මාසික ගිණුම් සාරාංශය හරහා ණය ශේෂය නිරවුල් කර ඇත.	<u>වැඩ තහනම් කල නිලධාරීන්</u> ➢ 2023 වර්ෂයට අදාල සැසඳුම් ප්‍රකාශය අනුව වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ ණය කිසිවක් නොමැති බව සඳහන් කරමි.

	<u>සේවය අතහැර ගොස් ඇති නිලධාරින්</u> ➢ ආර්.ඒ. අජිත් කුමාර මයා (කා.කා.ස.) නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති වෙත වාර්තා කිරීම හා ඊට අදාල පිළිතුරු 2024.01.06 දින ලැබී ඇත. ➢ එච්.පී. හරිස්චන්ද්‍ර මයා ග්‍රාම නිලධාරි - මිණිපේ	<u>සේවය අතහැර ගොස් ඇති නිලධාරින්</u> ➢ 2024.01.06 දිනැතිව නීතිපති උපදෙස් ලැබී ඇති අතර, නඩු ගොනුව අස්ථානගත වී ඇති බැවින් ඇපකරුවන් සොයා ගැනීම අපහසුව ඇත. කෙසේ වෙතත්, 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 අනුව හිඟ ණය ශේෂ අත්හැර දැමීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරගෙන යනු ලබන බව සඳහන් කරමි. ➢ 2023.09.13 දින වන විට ණය අයකරගෙන අවසන් වී ඇත. 2023 සැසඳුමෙහි මෙම ණය ශේෂය නොමැත. එමෙන්ම, 2023 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශය අනුව ඩී.එස්.පී. ධර්මසේන මයාගේ (රියදුරු) වර්ෂයක කාලයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂයක් පවතින අතර, එම හිඟ ණය ශේෂය මේ වන විට ඇපකරුවන්ගෙන් මාසිකව අයකරමින් පවති. (2024.07.31 වන විට ශිඟ ණය ශේෂය - රු.96,255.00 කි)
මු.රෙ. 427(2) අනුව මාසික සැසඳීම් වාර්තා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබීම	මහා භාණ්ඩාගාරයේ පවතින ගිණුම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින ගිණුම් ITMIS හා CIGAS මගින් ඒකාබද්ධ ගිණුම් සාරාංශය සකස් කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර ශේෂයන් සමඟ මාසිකව සැසඳීම් සිදු කර වෙනස්කම් පවතින විට පමණක්	වෙනස්කම් නොමැති අවස්ථා වලද ඒ බව භාණ්ඩාගාරයට දැන්වීමට 2024 වර්ෂයේ ජනවාරි සිට ජූලි මස දක්වා කටයුතු කර ඇත.

	වෙනස්කම් දන්වා භාණ්ඩාගාරයට දැනුම්දීමට කටයුතු සිදු කිරීම සිදු කර ඇත. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 257/2017 ප්‍රකාරව හා වාර්ෂික ගිණුම් සැකසීමේ චක්‍රලේඛයට අනුව වෙනස්කම් සිදුවන අවස්ථාවලදී පමනක් වාර්තා කිරීම චක්‍ර ලේඛයේ සඳහන් කර ඇති අතර, මු.රෙ. 426 ප්‍රකාරව කටයුතු කරන බව සඳහන් කරමි.	
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබීම	අතිගරු ජනාධිපතිතුමාගේ ශෝකය ප්‍රකාශ වැඩ සටහන් සඳහා මල්වඩම් මිලදී ගැනීමට ලබා දුන් අත්තිකාරම් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ප්‍රමාද වී වෙක්පත් ලැබී ඇත. මෙහි අභ්‍යන්තර පාලනය වඩාත් විධිමත් කිරීම සඳහා 2023.10.30 දිනැති අංක 03/2023 දරන දිසාපති නියෝගය නිකුත් කර ඇත.	මේ වන විට අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයක් සිදු වී නැත.
අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබීම	අක්මුදල් සැසඳීමේ කටයුතු කාර්තු පදනමින් සිදු කර ඇති අතර, භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමේදී ප්‍රමාදයක් සිදු වී ඇත. මේ වන විට අඛණ්ඩව කාර්තු පදනමින් සැසඳීම් කටයුතු සිදු කිරීම දැඩි අධීක්ෂණය යටතේ සිදු වීම.	මේ වන විට නියමිත දිනට පෙර අදාල සැසඳුම් ප්‍රකාශ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, 2024.06.30 දින තෙක් අදාල වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
මු.රෙ. 94(1) ප්‍රකාරව වැය ශීර්ෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබීම	සෑම වර්ෂයකම අවසන් මාස වලට අදාල දුරකථන, ජල විදුලිය හා වෙනත් ගිවිසුම්ගත සේවා වලට අදාල බිල්පත් ඊලඟ වර්ෂය ආරම්භයේ ලැබෙන අතර, ඒ අනුව පෙර වර්ෂයේ අවසන් මාසයට අදාල බිල්පත් ප්‍රවර්තන වර්ෂය ආරම්භයේදී ගෙවනු ලබයි. ඒ	2024 අවසන් මූල්‍ය ප්‍රකාශයෙහි බැරකම් වලට එළඹීම නිවැරදිව සැලසුම් කරමින් පැවතීම.

	අනුව උක්ත සේවාවල රේටයන් ඉහළ යාමද වියදම වැඩි වීමට හේතු වූ අතර අත්‍යාවශ්‍ය කාරණා සඳහා අමතර ප්‍රතිපාදන නොලැබුණු නිසා මාරු කරගෙන ඇත. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 01/2024 අනුව වියදම් කළමනාකරණය කිරීමට කටයුතු කරමින් පවති.	
	දෙවන කොටස	
දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මාසිකව පවත්වා නොතිබීම	2022 වර්ෂය තුළ රට තුළ වූ ආර්ථික අස්ථාවර භාවය හා වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයන් ලද උපදෙස් අනුව මෙම කමිටු පැවැත්වීමේ අරමුණු හදුනාගෙන, අත්‍යවශ්‍යයෙන්ම පැවැත්විය යුතු කමිටු වාර කිහිපයකට සීමා කිරීම සිදු කරන ලදී. එහෙත් ජනතාවගේ රාජකාරි ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කමිටුව වෙත ලැබී තිබූ ගැටළු, අදහස් හා යෝජනා සම්බන්ධයෙන් අවස්ථානෝචිතව Zoom තාක්ෂණය ඔස්සේ හා පවත්වන ලද අනෙකුත් රැස්වීම් වලදී අදාල වගකිව යුතු නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.	2023 වර්ෂයේදී රැස්වීම් වාර 10 ක් සහ 2024 වර්ෂයේ ජූලි මස 31 දින වන විට රැස්වීම් වාර 6 ක් පැවැත්වීමට කටයුතු කර ඇත.
ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබීම	- එම -	2023 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් සමුළු 02 පවත්වා ඇත.
1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පණත අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් මාසිකව පවත්වා නොතිබීම	- එම -	2023 වර්ෂයේදී කමිටු වාර 06 හා 2024 වර්ෂයේදී කමිටු වාර 03 පවත්වා ඇත.
දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබීම	- එම -	2023 වර්ෂයේදී කමිටු වාර 05 සහ 2024 දී කමිටු වාර 04 පවත්වා ඇත

දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබීම	- එම -	2023/24 මහ කන්නයේ කමිටු රැස්වීම හා 2024 යල කන්නයේ කමිටු රැස්වීම මේ වන විට පවත්වා ඇත.
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම කාර්තුවකට එක බැගින් රැස් වී නොතිබීම	- එම -	2023 වර්ෂයේදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර 10 ක් පවත්වා ඇති අතර, ඒ සෑම අවස්ථාවකදීම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවට අදාල ගැටළු සහ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කර ඇත.
දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස් වී නොතිබීම	- එම -	2023 වර්ෂයේදී කමිටු වාර 03 සහ 2024 වර්ෂයේදී කමිටු වාර 04 පවත්වා ඇත.
දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස්වී නොතිබීම	- එම -	2022.12.28 - මුල් භාගය 2023.07.28 - අග භාගය වශයෙන් 2023 වර්ෂය වෙනුවෙන් මිල නියම කිරීමේ කමිටු දෙකක් පවත්වා ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබීම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල වසම් භාරව සේවය කරන සංවර්ධන නිලධාරීන්(ආර්ථික සංවර්ධන නිලධාරීන්) හැර අනෙකුත් සියළුම නිලධාරීන් සාමාන්‍ය ස්ථානමාරු වීම් ක්‍රමවේදය යටතේ වාර්ෂිකව ස්ථාන මාරු කරනු ලැබ ඇත. එහෙත් පහත හේතු මත සංවර්ධන නිලධාරීන් උපරිම සේවා කාලයක් සම්පූර්ණ කළද ස්ථාන මාරු කිරීමට නොහැකි වී ඇත. • ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තිය සංගම්වල විරෝධතාවය • ආර්ථික සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටතට ඔවුන්ගේ ඉල්ලීමකින් තොරව ස්ථාන මාරු නොකරන ලෙසත්, දිස්ත්‍රික්කය තුළ වාර්ෂික ස්ථාන මාරු තාවකාලිකව අත්හිටුවන ලෙසටත් උපදෙස් ලබා	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ඉහත ලිපිය මෙතෙක් අවලංගු කර නොමැති බැවින්, 2023 හා 2024 වර්ෂවලදී උපරිම සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් හැර අනෙකුත් සියළු තනතුරුවල ස්ථාන මාරුවීම් නියමිත පරිදි සිදු කර ඇත.

	දෙන ලද ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA-1/1/9/4 හා 2021.11.30 දිනැති ලිපිය	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ වීම	2022 වර්ෂය ගිණුම් සඳහා තත්වාගණනය කල විගණන මතයක් ලබා දී ඇත. අභ්‍යන්තර පාලනයේ වැඩි දියුණු කිරීම් කර හිතකර විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.	2023 වර්ෂයේද තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබාගෙන ඇත. අඛණ්ඩ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීමටත්, විනිවිධභාවයෙන් යුතුව කටයුතු කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන, පසුවිපරම් කරමින් නිවැරදි අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි. එමගින් හිතකර මතයක් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

චන්දන තෙන්නකෝන්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති මහනුවර
සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්

චන්දන තෙන්නකෝන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම් මහනුවර
සහ
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

එන්.බී.එල්.එම්. සමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී

එන්. බී. ජී. එල්. එම්. සමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙනුවට